# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

NALANDA VIDYALAYA COLOMBO 10

| 11 ශ්‍රේණිය | නාට්‍ය හා රංග කලාව | 02 ඒකකය |
| --- | --- | --- |

**ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.**

- 2.1, 2.2, 2.3, 2.4, 2.5, 2.6, 2.7, 2.8
- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. පිටපතේ ඇති අජීවී චරිත ලෙයින් මසින් පිරි සැබෑ මිනිසුන් බවට පත් කරන්නේ,

(1). වේදිකා පරිපාලන (2). සංවිධායක (3). රචකයා (4). නළුවා

02. නළුනිළියන්ගේ හා අධ්‍යක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිස පිටපතේ වරහන් තුළ ඇත්තේ,

(1). රංග විධාන ලෙසයි
(2). රංගරචනය ලෙසයි
(3). පාත්‍ර වර්ගයා ලෙසයි
(4). අභිනය ලෙසයි

03. අධ්‍යක්ෂකවරයාගේ කාර්යය වනුයේ,

(1). නළු නිළියන් රංගනය සඳහා මෙහෙය වීමයි
(2). මූල්‍ය කටයුතු මෙහෙය වීම
(3). නාට්‍ය දර්ශන සංවිධානය කිරීමයි
(4). පුහුණුවීමේ සිට නාට්‍ය වේදිකාව දක්වා සියලු කටයුතු පරිපාලනය කිරීමයි

04. සොඳුරු ආඥාදායකයා යනු,

(1). නාට්‍ය රචකයා (2). නළුවා ය (3). අධ්‍යක්ෂකවරයා ය (4). නිෂ්පාදකවරයා ය

05. නාට්‍ය නිෂ්පාදනය සඳහා අවසර ලබාගත යුත්තේ,

(1). සංස්කෘතික අමාත්‍යාංශයෙනි
(2). ටවර්හෝල් රඟහල පදනමිනි
(3). රඟුම් පාලක මණ්ඩලයෙනි
(4). අධ්‍යාපන අමාත්‍යාංශයෙනි

06. නාට්‍ය පිටපතක අන්තර්ගත නොවන අංගය වනුයේ

(1). ජීවන දෘෂ්ටිය (2). ගැටුම (3). චරිත (4). වේෂභූෂණ

07. නළුවරණය යනු,

(1). රංගනය සඳහා සුදුසු ආනුෂාංගික ශිල්පීන් තෝරා ගැනීමයි
(2). අධ්‍යක්ෂක රංග භූමිය සැලසුම් කරයි
(3). රංගනය සඳහා සුදුසු නළුනිළියන් තෝරා ගැනීම
(4). රංගනයට ප්‍රවිශ්ට වීමයි

08. අභිරූපණය සම්බන්ධයෙන් නොගැළපෙන ප්‍රකාශය වන්නේ,

(1). තේවල හා සාමූහිකව ඉදිරිපත් කරයි

(2). සතර අභිනයම යොදා ගනියි.

(3). මුහුණු අංග රචනය කරයි

(4). ඇස්වලින් හා අංගචලනයෙන් ප්‍රේක්ෂකයා ග්‍රහණය කරගනියි.

09. නාට්‍ය රංගගත වන මොහොතේදී දර්ශනයෙන් දර්ශනයට පසුතල මාරු කිරීම කරනු ලබන්නේ,

(1). වේදිකා පරිපාලක

(2). නාට්‍ය අධ්‍යක්ෂක

(3). අර්ථපති

(4). රංග වින්‍යාස ශිල්පියා

10. නාට්‍ය නිෂ්පාදනයන් සඳහා මුදල් යොදවන්නේ,

(1). අධ්‍යක්ෂකවරයා යි

(2). නිෂ්පාදකවරයා යි

(3). වේදිකා පරිපාලකවරයා යි

(4). අර්ථපති යි

11. අභිරූපණ රංගනයක් සඳහා

(1). වාචික අභිනය අවශ්‍ය වේ.

(2). වාචික අභිනය හැර සෙසු අභිනය භාවිතා කරයි

(3). අතිශෝක්තියෙන් ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය වේ

(4). රිද්මයක් පවත්වා ගැනීමක් අවශ්‍ය නොවේ.

12. නාට්‍යයක් සඳහා වේෂභූෂණ නිර්මාණයේදී

(1). නාට්‍යයේ ශෛලියට ගැළපිය යුතුය

(2). නළුවාට පහසුවිය යුතුය

(3). වේෂභූෂණ ශිල්පියා ගේ අභිමතය පරිදි නිර්මාණය කළ හැකිය

(4). රංගාලෝකය, අංග රචනය යන අනුශාංගික අංග සමඟ ගැළපිය යුතුය

13. ක්ෂණික නිරූපණයක්,

(1). පිටපතක් අනුව ඉදිරිපත් කරයි

(2). දීර්ඝකාලීන පුහුණුවකින් පසු ඉදිරිපත් කරයි

(3). වාචික අභිනයෙන් තොරව භාවිතා කරයි

(4). තම පරිකල්පන ශක්තිය මෙහෙයවා නිර්මාණය කර ගනියි.

14. රංගභූමි ආලංකරණය සම්බන්ධයෙන් අදාළ නොවන්නේ,

(1). රංගභූමි අලංකරණය සංකේතාත්මකව ඉදිරිපත් කරයි

(2). රංගභූමි අලංකරණය යනු වේදිකාව අලංකරණය කිරීමයි

(3). රංගාලෝකය හා රංග වස්ත්‍ර නිර්මාණය හා සංයෝගව පැවතිය යුතුය.

(4). රංගභූමි අලංකරණය සඳහා යොදා ගන්නා සෑම භාණ්ඩයක්ම නාට්‍ය හා සම්බන්ධ විය යුතුය

15. නාට්‍යයක් නිෂ්පාදනය සඳහා අවසර ලබාගත යුතු වන්නේ,

(1). රැගුම්පාලක මණ්ඩලයෙනි

(2). අධ්‍යාපන අමාත්‍යාංශයෙනි

(3). සංස්කෘතික අමාත්‍යාංශයෙනි

(4). නගර සභාවෙනි

16. අභිරූපණ රංගනයේදී භාවිතා නොවන්නේ,

(1). අධිතාත්වික රංගනයයි
(2). වාචික අභිනයයි
(3). ආංගික අභිනයයි
(4). සාත්වික අභිනයයි

17. වේදිකාව මත මොහොතින් මොහොත මැවෙන දර්ශනය හඳුන්වන්නේ,

(1). මායාව නමිනි
(2). ප්‍රේක්ෂාව නමිනි
(3). රූපණය නමිනි
(4). රස වින්දනය නමිනි

18. වේදිකා පරිපාලක,

(1). පෙළ මතක්කර දෙන්නන් මෙහෙයවයි
(2). පිසුතලය සකස්කරයි
(3). වේදිකාව මත නළු නිළියන් මෙහෙයවයි
(4). නළු නිළියන් නියමිත වේලාවට වේදිකාවට එවයි

19. නාට්‍ය අධ්‍යක්ෂකවරයා,

(1). නාට්‍යයට සුදුසු නළුනිළියන් තෝරයි
(2). නළු නිළියන් විනය පාලනය කරයි
(3). නළු නිළියන් සමඟ පිටපත සාකච්ඡා කරයි
(4). ආනුෂාංගික ශිල්පීන් මෙහෙයවයි

20. චරිත නිරූපණයේදී නළුවා සැලකිලිමත් විය යුතු වන්නේ,

(1). අභිනය පෑම සහ සංවාදය
(2). නාට්‍ය ගීත කෙරෙහිය
(3). වේදිකාව පිළිබඳවයි
(4). ප්‍රේක්ෂකයා කෙරෙහිය

21. නාට්‍ය පිටපතෙහි ඇති චරිත ප්‍රේක්ෂකයාට සමීප වන්නේ,

(1). වචන මගින්
(2). චරිත මගින්
(3). ආලෝකය මගින්
(4). රූපණය මගින්

22. අභිරූපණ රංගනයක් නිරූපණයේදී යොදා ගනුලබන ශිල්ප ක්‍රම වන්නේ,

(1). අභ්‍යන්තර ශිල්ප ක්‍රම හා බාහිර ශිල්ප ක්‍රම
(2). අනුකරණය හා අනුරූපනය
(3). බාහිර සමාරෝපය හා අභ්‍යන්තර සමාරෝපය
(4). වාචික අභිනය හා අංග චලනය

---

## II කොටස

- **ව්‍යුහගත රචනා ප්‍රශ්න**

01. i. කෙටි නාට්‍ය යන්න අර්ථ පැහැදිලි කරන්න.
ii. ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය වූ කෙටි නාට්‍ය 3ක් නම් කරන්න.
iii. දිගු නාට්‍යයකට වඩා කෙටි නාට්‍ය වෙනස් වීමට හේතු පැහැදිලි කරන්න.

02. i. අභිරූපණය යනු කුමක්ද?
ii. අභිරූපණ ශිල්පක්‍රම කීයද? ඒවා කෙටියෙන් හඳුන්වන්න.
iii. අභිරූපණයේ සුවිශේෂී ලක්ෂණ පැහැදිලි කරන්න.

03. i. චරිත නිරූපණය යන්න විග්‍රහ කරන්න.

ii. චරිත නිරූපණයේදී වැදගත්වන කරුණු පැහැදිලි කරන්න.

04. i. නාට්‍යමය අවස්ථා විස්තර කරන්න.

ii. විකෘති නාට්‍යයේ නාට්‍යමය අවස්ථා ඇති ස්ථාන 4ක් ලියන්න.

iii. ඔබට කැමති කතන්දරයක් තෝරාගෙන එහි නාට්‍යමය අවස්ථා ගොඩනැගෙන අයුරින් නිර්මාණය කරන්න.

05. i. නාට්‍ය පෙළක තිබිය යුතු මූලිකාංග මොනවාද?

ii. ඔබ නාට්‍ය රචකයෙකු නම් නාට්‍ය පෙළක් නිර්මාණයේදී සැලකිලිමත් වන කරුණු මොනවාද?

06. i. නාට්‍යයක් සඳහා නළුනිළියන් තෝරා ගන්නා ආකාරය විස්තර කරන්න.

ii. නළුවරණය යන්න අර්ථ විග්‍රහ කරන්න.

iii. නළුවාගේ රංගන කාර්යයේදී අර්ථ නිරූපණය සාර්ථක වීම සඳහා අංග රචනය වැදගත් වන්නේ කෙසේදැයි විස්තර කරන්න.

07. i. වේෂභූෂණ යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

ii. වේෂ භූෂණ භාවිතා කිරීමෙන් නාට්‍යයේ සාර්ථකත්වයට බලපාන ආකාරය විස්තර කරන්න.

iii. වේෂභූෂණ නිර්මාණයේදී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද?

08. i. වේදිකා පසුතල යන්න විස්තර කරන්න.

ii. වේදිකා නාට්‍යයක් සඳහා පසුතල නිර්මාණ කිරීමේදී සැලකිලිමත් විය යුතු ආකාරය ලියන්න.